EN/03/ජූලි- අගෝස්තු /2023

# BELIEVERS EASTERN CHURCH

**Office of the Metropolitan, Synod Secretariat, St. Thomas Community, Thiruvalla, Kerala, India.**

# එඬේර හසුන

සියලු අගරදගුරුතුමන් සහ රදගුරුතුමන්, පූජකතුමන් සහ ඩීකන් පියතුමන්, ඉවැන්ජලිස්තතුමන් සහ සහෝදරියන් සහ බිලීවර්ස් ඊස්ටන් චර්ච්හි ලොව පුරා සිටින විශ්වාසිකයින් හට පියාණන් වහන්සේගේ ද, පුත්‍රයාණන් වහන්සේගේ ද, ශුද්ධාත්මයාණන් වහන්සේගේ ද නාමයෙන් ආසිරි සහ ආචාරය - ආමෙන්.

ක්‍රිස්තුන් වහන්සේ තුළ සෙනෙහෙවතුනි,

අප පැමිණ සිටින්නේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ අන්වෙසක් වීමේ සමය වෙතය. අපගේ ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ අන්වෙසක් වීම සිහිපත් කරමින් එය සමරණ අවස්ථාවේ දී (ශුද්ධවර මතෙව් 17:1-8), ඔවුන් වහන්සේගේ දිව්‍යමය මහිමය එළිදරව් කරනු ලබයි. මෙම මංගල්‍යය අපට මතක් කර දෙන්නේ අපගේ ඕතඩොක්ස් කිතුණු ජීවිතයේ ඉලක්කය දෙවියන් වහන්සේගේ දිව්‍යමය ස්වභාවයට වඩ වඩාත් පරිවර්තනය වීමය. (2 කොරින්ති 3:18) මෙම ක්‍රියාවලිය සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන්නේ ‘දේවාණුරෝපනය’(දිව්‍ය ස්වභාවයට අනුවර්ථනය වීම) හෝ ‘තියෝසිස්’ ලෙසිනි. නමුත් අප මෙය සාක්ෂාත් කරගන්නේ කෙසේද?

## 1. අපගේ මිණුම් දණ්ඩ ජේසුස් වහන්සේ විය යුතුය.

මුල් කාලයේ විශ්වාසිකයින් කිතුණුවන් ලෙස හඳුන්වනු ලැබීය, මන්ද ඔවුන්ගේ ජීවිත ගතකළේ ඉතා කරුණාවත්ත ආකාරයෙනි. (ක්‍රියා 11:26) ඇත්ත වශයෙන්ම, මුල් සභාවේ පීතෘවරයා සහ රදගුරුතුමා, වන ශුද්ධවර ඉග්නේෂියස් තුමාණන් තමන්ව හඳුන්වාගනු ලැබුවේ දෙවියන් වහන්සේ රැගෙන යන්නා ලෙසය! අද, අප අවට සිටින මිනිසුන් අප දෙස ඉතා ප්‍රවේශමෙන් නිරීක්ෂණය කරනු ලැබුවහොත්, ඔවුන් අපව කෙසේ හඳුන්වනු ලබයිද? ඔවුන් අපව ඕපාදූප කියන, ප්‍රකෝපකාරී, මුදල් වලට කෑදර,

කැරලිකාර, අහංකාර, හෝ අනුකම්පා විරහිත, අය ලෙස හඳුන්වනු ලබයිද? එසේ නොමැතිනම්, කිතුණුවන් ලෙස හැඳින්වීමට අප සැබවින්ම සුදුස්සන් වනවාද?

**අපගේ ආකල්ප සහ හැසිරීම ක්‍රිස්තුන් වහන්සේ හා සමාන නොවීම පිළිබඳව නිදහසට කරුණු බොහොමයක් ඉදිරිපත් කිරීමට අපට පුළුවන, නමුත් අපගේ ආදර්ශය විය යුත්තේ ජේසුස් වහන්සේය. අපගේ ගැඹුරුතම ආශාව විය යුත්තේ, "ස්වාමීන් වන ජේසුස් වහන්ස, මාගේ කැමැත්ත නම් ඔබ වහන්සේ හා සමාන වීමය, එවිට ඔබගේ නාමය ගෞරවයට පැමිණවීමට මට හැකි වන්නේය." යන්නයි. මෙයින් අදහස් කරන්නේ අප අපගේ සංස්කෘතිය, අපගේ පවුල් පසුබිම, අපගේ අතීත අසාර්ථකත්වයන්, සහ වෙනත් පුද්ගලයින්ගේ දුර්වල ආදර්ශයන් අපගේ වැරදි හැසිරීම් සඳහා නිදහසට කරුණු ලෙස භාවිතා නොකරන බවය. එමෙන්ම, අප අසමත් වන සෑම අවස්ථාවකම, අප ජේසුස් වහන්සේගේ යාච්ඤාව වන *"ස්වාමි වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්ස, දේවපුත්‍රයාණෙනි, පව්කාරයෙකු වන මා හට කරුණා කළ මැනව."* යාච්ඤා කළ යුතුය.**

2. **අන් අය කුමක් කළද ජේසුස් වහන්සේගේ ශුද්ධ වූ වචනයට කීකරු වීමට අප තීරණය කළ යුතුය.**

ජේසුස් වහන්සේ පැවසුවේ, ඔබ මට ප්‍රේම කරන්නේ නම්, මාගේ ආඥාවන්ට ඔබ කීකරු වනු ඇත. (ශුද්ධවර ජොහන් 14:15) එමනිසා, දෙවියන් වහන්සේට ඇති අපගේ කීකරුකම පෙන්වන්නේ ඔවුන් වහන්සේගේ වචනයට කීකරු වීම තුළිණි. අනිත් අය ඕපාදූප කතා කරන විට, අප ඔවුන් සමග එකතු නොවන්නෙමු. ඔවුන් අධිකාරීත්වයට යටත් නොවන්නේ නම් හෝ විවේචනාත්මක ස්වභාවයක් ප්‍රදර්ශනය කරන්නේ නම්, ඔවුන් සමග අප කිසිදු ආකාරයක කොටස්කරුවන් නොවිය යුතුය. ඇයි? මන්ද යත්, දෙවියන් වහන්සේ අපට දී ඇති ඔවුන් වහන්සේගේ උපදෙස් අනුගමනය කිරීමට අප තෝරාගෙන ඇති බැවිනි. ශුද්ධ ලියවිල්ලේ ඇති පරිදි, අපි නිරාහාරව සිටින්නෙමු, දන් දෙන්නෙමු, යාච්ඤා කරන්නෙමු.

3. නරක ඇසුර අත හරින්න.

"ඔබේ මිතුරන් කවුරුන්දැයි මට කියන්න, එවිට ඔබ කවුරුන්දැයි මම ඔබට කියමි"යි යනුවෙන් පැරණි කියමනක් ඇත. අපගේ සමීප යහළුවන් කවුරුන්ද හෝ අප කාලය ගත කරන්නේ කා සමග ද යන්න වැදගත් නැතැයි අපට සිතිය හැකිය. නමුත් එය සතුරාගේ ඉතාමත් බලවත්ම රැවටීමක් වන්නේ ය. අප ඇසුරු කරන්නන්ගේ ඍණාත්මක හැසිරීම, විවේචනාත්මක ස්වභාවය සහ කාරලිකාර ආකල්ප තුළින් අප තුළ ද ටිකෙන් ටික විෂ පැතිර යන්නේය. ශාන්ත පාවුළුතුමා අණ කරන්නේ, 'තවද සහෝදරයරුනි, අපෙන් ලැබූ උපදෙස් අනුව නොව, අලසකමින් හැසිරෙන සියලු සහෝදරයන්ගෙන්

වෙන්ව සිටින මෙන් අපගේ ජේසුස් ක්‍රිස්තුන් සමිඳාණන්ගේ නාමයෙන් අපි ඔබට අණ කරමු.' (2 තෙසලෝනික 3:6) යනුවෙනි. 'මුළා නොවන්න, "නරක ආශ්‍රයෙන් හොඳ චරිත වැනසේ."(1 කොරින්ති 15:33)

ක්‍රිස්තුන් වහන්සේ තුළ ප්‍රේමණීය දරුවෙනි, අන්වෙසක් වීමේ මංගල්‍යය සමරණ මෙම අවස්ථාවේදී පවා, දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ස්වභාවයට අපව පරිවර්තනය වන ලෙස ඔවුන් වහන්සේ ප්‍රාර්ථනා කරන බව අප අමතක නොකළ යුතුය. (2 පේදුරු 1:4)
ඉන්දියාවේ මනිපූර් ප්‍රාන්තය වෙනුවෙන් අපි දිගටම යාච්ඤා කරමු - එහි සාමය පවතින පිණිසත්, දුෂ්කර කාලයන්හිදී පවා අපගේ සහෝදර සහෝදරියන්, නිර්භීතව, ධෛර්යය සම්පන්නව ක්‍රිස්තුන් වහන්සේට සමාන වන පිණිසත්.

එසේම, අපගේ සෙමනේරිවල අධ්‍යයනය කටයුතු වල නිරත වන තරුණ තරුණියන් ගැනද, දයාවේ සොයුරියන් ලෙස පුහුණුව ලබන අය පිළිබඳව ද, ශුද්ධ වූ සභාවේ සේවය උදෙසා තෝරාගෙන ඇති අපගේ තරුණ තරුණියන් උදෙසා ද දිගටම යාච්ඤා කරන මෙන් ඉල්ලමි.

ශුද්ධ වූ සභාවේ සේවයේ නියුතු,
ක්‍රිස්තුන් වහන්සේ තුළ ඔබගේ පියාණන්,



මෝරන් මෝර් ඇතනේසියස් පළමු යොහාන්
මෙට්‍රොපොලිටන් හිමිපාණන්.

---

සැ.යු: කරුණාකර මෙය සියලුම ප්‍රාදේශීය භාෂාවන්ට පරිවර්තනය කර විශ්වාසිකයින් දිරිගැන්වීම සඳහා සියලුම දේවස්ථාන වල කියවීමට කටයුතු කරන්න.

දිනය : 2023 ජූලි මස 25

ස්ථානය: ශුද්ධ වූ සිනෝඩය.